# සිදත්සඟරාව පද්‍යකරණය සඳහා රචිත කෘතියකි යන මතය පිළිබඳ විමසුමක්

*චාන්දනී, ඩබ්.*[1]

සිදත්සඟරාව දැනට විද්‍යමාන ව පවතින පැරණිතම ව්‍යාකරණ ග්‍රන්ථයයි. මෙය 13 වන සියවසේ දී දඹදෙණි යුගයේ විසූ පතිරජ පරිවේණාධිපති හිමියන් විසින් රචනා කරන ලද බැව් පිළිගැනුණ ද මෙහි කර්තෘත්වය සම්බන්ධයෙන් පවතින විද්වත් මතය විවාදාපන්න ය. සිදත්සඟරාව සිංහල භාෂාවේ ව්‍යාකරණ ක්ෂේත්‍රය අලළා රචනා වුව ද එය කවි පබඳින ආධුනිකයන් විෂයෙහි කළ බව කෘතියෙහි සඳහන් වේ. එබැවින් මෙය රචනා වී ඇත්තේ සිංහලයේ ව්‍යාකරණය සම්බන්ධයෙන් ද නැතහොත් පද්‍ය බන්ධනය සඳහා ද යන්න විමසා බැලීම වැදගත් වේ. ඇතැම් විද්වතුන් අදහස් කරන පරිදි සිදත්සඟරාවේ එන බොහෝ සූත්‍ර හෝ සිද්ධාන්ත ව්‍යාකරණ ක්ෂේත්‍රයට පිවිසෙන ආධුනිකයින්ට ප්‍රයෝජනය සඳහා නොවන අතර එම සූත්‍ර හා සිද්ධාන්ත ග්‍රහණය කර ගැනීමට ව්‍යාකරණය පිළිබඳ පෘථුල දැනුමක් අවශ්‍ය වේ. දඹදෙණි යුගයේ ඓතිහාසික හා සාහිත්‍යමය මූලාශ්‍රය ඇසුරෙන් සිදු කළ මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ පරිදි සිදත්සඟරාව, ව්‍යාකරණ ග්‍රන්ථයක් සේ සැලකුව ද එය පද්‍යකරණය සඳහා වූ විමර්ශනයක් බැව් පෙනේ. ඒ අනුව සිදත්සඟරාව සිංහල භාෂාවේ ව්‍යාකරණ ක්ෂේත්‍රයට වඩා පද්‍ය බන්ධනයට පිවිසෙන දුහුනන්ගේ දැනුම ප්‍රසාරණය කිරීමේ පරමාර්ථයෙන් රචනා වූ ග්‍රන්ථයක් බව ප්‍රතීයමාන වේ.

ප්‍රමුඛ පදඃ දඹදෙණි යුගය, පද්‍යකරණය, ව්‍යාකරණය, සිදත්සඟරාව, සූත්‍ර හා සිද්ධාන්ත

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* Chandanibndr@gmail.com